# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1721/4 - 2011 අගෝස්තු 29 වැනි සඳුදා - 2011.08.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. බී. 11/79.

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 4 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (රැඳවියන් සහ රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් පිළිබඳ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම බලපැවැත්වූ යම් හදිසි අවස්ථා නියෝගයක විධි විධාන ප්‍රකාරව, රඳවනු ලැබ ඇති යම් තැනැත්තෙකු, මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වූ වහාම අදාළ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ මහේස්ත්‍රාත්වරයා විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන ප්‍රකාරව ඒ තැනැත්තා රැඳවුම් භාරයට පත් කිරීමට කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙකු -

(අ) මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම බලපැවැත්වූ යම් හදිසි අවස්ථා නියෝගයක විධිවිධාන ප්‍රකාරව වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු විසින් රිමාන්ඩ් භාරයට පත් කරනු ලැබ ඇතිනම් ; හෝ

(ආ) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ අර්ථානුකූලව යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමට සම්බන්ධ වූ හෝ ඊට ප්‍රවේදිතාවක් දක්වා ඇති හෝ, ඒ නීති විරෝධී ක්‍රියාකාරකම සිදු කිරීමට සම්බන්ධ වූ බවට හෝ ඊට ප්‍රවේදිතාවක් දක්වා ඇති බවට සාධාරණව සැක කරනු ලැබ ඇතිනම් හෝ,

මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට බලපවත්වන පරිදි 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ රිමාන්ඩ් භාරයට පත් කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය. තැනැත්තන් සිරභාරයට ගැනීම හා ඔවුන්ට ඇප දීම සම්බන්ධයෙන් එකී පනතේ අන්තර්ගත විධිවිධාන ඒ තැනැත්තා සම්බන්ධයෙන් එවිට අදාළ විය යුතු ය.

1A - G 14604 — 840 (2011/08)

3. (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ප්‍රකාශනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද හදිසි අවස්ථාව ඉකුත්ව ගොස් තිබීම සහ (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් වලංගුවීම සහ බලාත්මකවීම 2011 අගෝස්තු මස 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් වී තිබීම යන කරුණ නොතකා, අධිකරණය භාරයෙහි හැර එවැනි යම් නියෝගයක් ප්‍රකාරව අත් අඩංගුවෙහි රඳවනු ලැබ ඇති කිසිම තැනැත්තකු 2011 අගෝස්තු මස 30 වන දින සිට දින 30ක් ඉක්ම යන තෙක් නිදහස් කරනු නොලැබිය යුතු ය ;

එසේ වුවද, ඉහත කී කාලසීමාව ඉකුත් වීමට පෙර 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ III වන කොටස ප්‍රකාරව රඳවා ගැනීමේ නියෝගයක්, ඒ තැනැත්තා සම්බන්ධයෙන් නිකුත් කරනු නොලැබී නම්, එම පනතේ II වන කොටසේ විධිවිධාන යටතේ හෝ තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ ඒ තැනැත්තා මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කරනු ලැබ රිමාන්ඩ්භාරයට පත් කරන ලද්දේ නම් මිස, ඒ තැනැත්තා රඳවනු ලැබ සිටියේ යම් තැනැත්තකුගේ භාරයේ ද, එකී තැනැත්තා විසින් ඒ තැනැත්තා වහාම නිදහස් කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.